තාක්ෂණික තොරතුරු පත්‍රිකාව

# කෘෂි තාක්ෂණ ලුහුඬින්

පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.
කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය

වෙළුම 10 අංක 1 2008 ජනවාරි-පෙබරවාරි

## මෙවර කලාපයෙන්


- අපි වවමු - රට නගමු දේශීය ආහාර නිෂ්පාදනය දිරිගැන්වීමේ ජාතික මෙහෙයුම.
- දෙහි වලට ආදේශකයක්- කැලමන්සි වගාව
- ඩේවිඩ් සෝනියා ශාකය හඳුනාගනිමු



**සංස්කරණය**
**ජයන්තා ඉලන්කෝන්**
ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය
තැ.පෙ. 18, පේරාදෙණිය


# "අපි වවමු - රට නගමු"

## දේශීය ආහාර නිෂ්පාදනය දිරිගැන්වීමේ ජාතික මෙහෙයුම - 2007 - 2010



ශ්‍රී ලංකාවේ සමාජීය, ආර්ථික හා සංස්කෘතික පදනම අතීතයේ පටන් කෘෂිකර්මාන්තය හා බැඳී පවතී. මෑතක සිට කෘෂිකාර්මික අංශයේ වර්ධන වේගය, කර්මාන්ත හා සේවා යන අංශ හා සැසඳීමේදී අඩු වර්ධන මට්ටමක පවතී. 2006 වර්ෂයේදී දළ ජාතික නිෂ්පාදනයට කෘෂිකර්ම අංශයේ දායකත්වය වැවිලි කර්මාන්ත, ධීවර හා වන සම්පත් අංශද ඇතුළුව 16.8% කි. මිලියන 20 කට ආසන්න ජනගහනයෙන් 32% පමණ සෘජුවම කෘෂිකර්මයේ නියැලෙති. මෙරට ග්‍රාමීය ජනතාවගෙන් 70% ක් පමණ කෘෂිකර්මය ආශ්‍රිත ජිවනෝපායක නියැලී සිටින අතර එයින් 25% - 30% ක් පමණ දරිද්‍රතාවයට ලක්ව සිටිති. බොහෝ ආහාර වර්ගවල ඒක පුද්ගල පාරිභෝජනය අවම පෝෂණ අවශ්‍යතාවට වඩා පහළ මට්ටමක පවතී. ග්‍රාමීය ප්‍රදේශයන්හි වයස අවුරුදු 5 ට අඩු දරුවන්ගෙන් 30% ක් පමණ මන්දපෝෂණයෙන් පෙළෙති. රටේ ආහාර අවශ්‍යතාවයෙන් 32% ක් පමණ වසරකට රුපියල් බිලියන 100 ක් පමණ වැය කරමින් ආනයනය කෙරේ. කිරි ආශ්‍රිත නිෂ්පාදන, මත්ස්‍ය ආහාර සහ සීනි හැරුණු කොට අතිරේක ආහාර බෝග, පළතුරු ඇතුළු ආහාර වර්ග ආනයනයට 2006 වසරේදී රුපියල් බිලියන 49 කට ආසන්න මුදලක් වැය කර ඇත.

ශ්‍රී ලංකාවේ පවතින වර්තමාන ආර්ථික රටාව අනුව ආහාර ද්‍රව්‍ය ආනයනයට අති විශාල මුදලක් මෙලෙස වැය කිරීම ඉතා අපහසුය. එමෙන්ම ආනයනය කරන බොහොමයක් ආහාර ද්‍රව්‍ය දේශීය වශයෙන් නිපදවා ගැනීමට ඇති හැකියාව අති විශාලය.

ලෝකයේ සෙසු රටවල ආහාර සහ ජෛව ඉන්ධන සැකසීම වැනි කර්මාන්ත සඳහා කෘෂි නිෂ්පාදනවලට ඇති ඉල්ලුම ඉහළ යන හෙයින් මෙරටට එම ද්‍රව්‍ය ආනයනය කිරීමට ඇති හැකියාවද සීමා වෙමින් පවතී.

**"අපි වවමු - රට නගමු" දේශීය ආහාර නිෂ්පාදනය දිරිගන්වමු**

ශ්‍රී ලංකාවේ මුළු ඉඩම් ප්‍රමාණයෙන් 86% ක් විවිධ කටයුතු සඳහා යොදාගෙන ඇතත්, වැවිලි භෝග සහ අපනයන භෝග හැරුණු කොට ආහාර නිෂ්පාදනය සඳහා යොදාගෙන ඇත්තේ මුළු ඉඩම් ප්‍රමාණයෙන් 57% කි.

වී වගාව සඳහා යෝග්‍ය ඉඩම් හෙක්ටයාර් 730,000 ක් ඇතත් සාර්ථක මහ කන්නයකදී වුවද විවිධ හේතු නිසා හෙක්ටයාර් 120,000 ක් පමණ වගා නොවේ. එමෙන්ම අතිරේක ආහාර භෝග සඳහා යෝග්‍ය ඉඩම් හෙක්ටෙයාර් 130,000 ක් පමණ ඇතත් සාර්ථක මහ කන්නයකදී ද හෙක්ටයාර් 40,000 ක් පමණ වගා නොකෙරේ.

දේශීය ආහාර භෝග ඵලදායිතාව අඩු මට්ටමක පවතින අතර, වී වගාවේ හා සියලුම අතිරේක භෝග වල උපරිම විභවයට ළඟා වීමට තවමත් හැකි වී නැත.

දේශීයව පුළුල් පරාසයක එළවළු නිෂ්පාදනය කළද එය ප්‍රමාණවත් වන්නේ වෛද්‍ය පර්යේෂණ අනුව නිර්දේශ කර ඇති වසරකට කි.ග්‍රෑ. 72 ක අවම ඒක පුද්ගල පාරිභෝජනයෙන් හරි අඩක් සපුරාලීමට පමණි.

2002 වසරේ කෘෂිකාර්මික සංගණනයට අනුව කෘෂිකාර්මික ඉඩම් හෙක්ටයාර් මිලියන 1.56 ක් ගොවි කාණ්ඩ මිලියන 3.25 අතරේ බෙදී ගොස් ඇත. එම සංගණනයට අනුව මෙම ඉඩම් කට්ටි වල වගාකරුවන්ගෙන් ගෙවත්ත පමණක් ඇති ගොවිකාරකයින් 382,300 ක්ද, ගෙවත්ත සහ වෙනත් ඉඩම් හිමි ගොවිකාරකයින් 559,241 ක්ද, වෙනත් ඉඩම් පමණක් ඇති ගොවිකාරකයින් 700,361 ක්ද සිටින බව වාර්තාවේ. මෙම ඉඩම් කට්ටි වලින් 90% කට වැඩි ප්‍රමාණයක තමන්ට අවශ්‍ය ආහාර භෝග සුලු වශයෙන් හෝ වගා කළ හැකි බව හඳුනා ගෙන ඇත.

එහෙයින් අපේ රට තව දුරටත් ආනයනයන් මත යැපෙන ජාතියක් ලෙස පැවතීම අනුමත කළ නොහැක. රටේ තිරසාර සංවර්ධනයක් තහවුරු කළ හැක්කේ ශීඝ්‍ර ලෙස දේශීය ආහාර නිෂ්පාදනය ඉහල නැංවීමෙන් පමණි. මේ සඳහා යටිතල පහසුකම් සලසා දියයුතු අතර ඒ සඳහා විදේශ විනිමය අවශ්‍ය වේ. දේශීයව නිපදවිය හැකි ආහාර ද්‍රව්‍ය වැඩියෙන් නිපදවීමෙන් ආනයන සීමා කර පිටරටට ගලායන විදේශවිනිමය ඉතිරි කළ හැකිය.

ශ්‍රී ලංකාව තුළ කෘෂිකාර්මික අංශයෙන්ද මේ සඳහා කෙරෙන දායකත්වය වැඩි කළ යුතු අතර, ඒ සඳහා කෙටිකාලීන හා මධ්‍යකාලීන උපායමාර්ග අනුගමනය කරමින් දේශීය ආහාර නිෂ්පාදන කඩිනම් වැඩසටහනක්, "අපි වවමු - රට නගමු" යන තේමාව යටතේ, "දේශීය ආහාර නිෂ්පාදන දිරිගැන්වීමේ ජාතික මෙහෙයුම" නමින් ආරම්භ කර ඇත. මෙම මෙහෙයුම 2007 මහ කන්නයෙන් ආරම්භ කර වසර 03 ක් පුරා ක්‍රියාත්මක කෙරේ (2007 - 2010).

## මෙහෙයුමේ අරමුණු

2007/08 මහ කන්නය ඉලක්ක කර ගනිමින් 2007 සැප්තැම්බර් 03 දින ආරම්භ කර ඇති මෙම ජාතික මෙහෙයුම මගින් පහත සඳහන් අරමුණු ඉටු කර ගැනීමට අපේක්ෂා කෙරේ.

- අත්‍යාවශ්‍ය ආහාර භෝග නිෂ්පාදනය වැඩි කිරීම
- ජාතික නිෂ්පාදනයට කෘෂිකර්මාන්තයේ දායකත්වය වැඩි කිරීම
- ජනතාවගේ ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව සහතික කිරීම
- ජනතාවගේ පරිභෝජන රටාව දියුණු කිරීම
- ආහාර ආනයනය සඳහා වැය වන විදේශ විනිමය වාර්ෂිකව අඩු කිරීම
- ගොවි ජනතාවගේ ආදායම් තත්ත්වය දියුණු කිරීම
- ඉදිරි වසර තුන තුළදී කාබනික පොහොර භාවිතය තුළින් රසායනික පොහොර භාවිතය 25% කින් අඩු කිරීම
- උචිත හා නව තාක්ෂණ ක්‍රම ව්‍යාප්ත කිරීම
- තරුණ තරුණියන් කෘෂිකර්ම ක්ෂේත්‍රයට නැඹුරු කිරීම
- පරිසර හිතකාමී හා දේශීය/පාරම්පරික කෘෂි ක්‍රමවේදයන් ප්‍රචලිත කිරීම

මෙම අරමුණු ඉටුකර ගැනීම සඳහා පහත අංගයන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

## ගෙවතු වගාව ප්‍රචලිත කිරීම

වර්තමානයේදී පැන නැගී ඇති ජීවන වියදම ඉහළ යෑම, මන්දපෝෂණය හා ආහාර අනාරක්ෂිතභාවය පිළිබඳ ගැටළු ආමන්ත්‍රණය කිරීමේ මෙවලමක් ලෙස ගෙවත්ත සංවර්ධනය කිරීම කාලීන අවශ්‍යතාවයකි. මේ යටතේ ජනතාවගේ එදිනෙදා ජීවිතයට අවශ්‍ය එළවළු, පළතුරු, අලබෝග හා ඖෂධ පැළෑටි වගී වගා කරවීමට උනන්දු කෙරෙන අතර, ඒ ගෙවතු වගාව තුළින් පහත සඳහන් අරමුණු කරා ළඟා වීමට අපේක්ෂා කෙරේ.

- තමන්ගේ ආහාරය තමන්ට රුචි ලෙස වගා කර ගැනීමේ ඉඩකඩ වැඩි කිරීම,
- පරිසර හිතකාමී වගා ක්‍රම ව්‍යාප්ත කිරීම තුළින් වස විස නැති ආහාර නිෂ්පාදනය දිරිගැන්වීම,
- පවුල් ඒකකය තුළ පෝෂණය, සෞඛ්‍යය හා ආර්ථිකය වර්ධනය කිරීම
- නිෂ්පාදකයා හා පාරිභෝගිකයා අතර භාණ්ඩ හුවමාරුවේදී සිදුවන නාස්තිය අවම වීම තුළින් පසු අස්වනු හානිය අවම කිරීම

කාබනික පොහොර හැකි පමණ යෙදවීමට ගෙවතු හිමියන් උනන්දු කෙරේ. සමාජයේ සියලු තරාතිරමේ පුද්ගලයන්ගේ දායකත්වය මේ සඳහා ලබා ගැනීමේ අපේක්ෂාවෙන් විවිධ ප්‍රජාවන් සම්බන්ධ කරගෙන ගෙවතු සංවර්ධනය කිරීමට සැලසුම් කර ඇත.

## පාර්ශවකරුවන් හා ප්‍රතිලාභීන් දිරි ගැන්වීම හා තරග පැවැත්වීම

දේශීය ආහාර නිෂ්පාදන දිරි ගැන්වීමේ ජාතික මෙහෙයුම, වැඩ සටහනේ අත්‍යාවශ්‍ය අංගයක් වනුයේ ප්‍රතිලාභීන් හා පාර්ශවකරුවන්

දිරි ගැන්වීමයි. ගෙවතු හා වගා ආදශීන පිහිටුවන සෑම ගොවියෙකුම, නිලධාරියෙකුම, පාසැලක්ම හා රජයේ ආයතනයක්ම ආවරණය වන පරිදි දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් තරඟ පැවැත්වීමට කටයුතු කෙරෙන අතර, ඒ සඳහා ත්‍යාග හා සහතික පිරිනැමීමට කටයුතු කෙරේ.

### ආහාර නිෂ්පාදනය නැංවීම

ආහාර සුරක්‍ෂිතතාවය පදනම් කරගත් දේශීය ජන ජීවිතයට සෘජුවම බලපාන්නාවූත්, අති විශාල විදේශ විනිමයක් වැය කර වාර්ෂිකව ආනයනය කරන්නාවූත් කෘෂි පාදක කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය ලෙස භාවිතා කරන්නාවූත්, අතිශයින් වැදගත් බෝග තෝරාගෙන නිෂ්පාදනය වැඩි කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනේ. ඒ අනුව,

පහත දැක්වෙන බෝග වර්ග වල නිෂ්පාදනය වැඩි කිරීමට අවශ්‍ය කටයුතු මෙම දිරිගැන්වීමේ ජාතික මෙහෙයුම යටතේ සිදු කෙරේ.

### i. වී

### ii. අතිරේක බෝග

බඩඉරිඟු, කුරක්කන්, මිරිස්, බිලූණු/රතු ලූණු, මුං, කව්පි, සෝයා බෝංචි, රටකජු, උඳු

### iii. පළතුරු

කෙසෙල්, පැපොල්, අන්නාසි, මිදි, අඹ, දෙළුම්, අලිපේර, මැංගුස්, රඹුටන්

### iv. එළවළු

බෝංචි, බටු, බණ්ඩක්කා, දඹල, තක්කාලි, මෑ, බුෂිටා, පලා වර්ග

### v. අල බෝග

අර්තාපල්, බතල, කිරි අල

### vi. කුළු බඩු

ඉඟුරු, කුරුඳු, ගම්මිරිස්, එනසාල්, කහ

දේශීය ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා වගා කළහැකි වුවත් වගා නොකර ඇති පුරන් කුඹුරු සහ මුඩු ඉඩම් නැවත වගාවට යොදගෙන වගා බිම් ප්‍රමාණය වැඩි කෙරේ. තවද එක් එක් බෝගයේ ඵලදායිතාව ඉහළ නැංවීම වඩා වැදගත් වන හෙයින් ඒ සඳහා විශේෂිත වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

විශේෂයෙන්ම අතිරේක භෝග නිෂ්පාදනය වැඩි කිරීමේදී එක් එක් භෝගය සඳහා භෝග කළාපියකරණයට අනුව විභව දිස්ත්‍රික්ක තෝරාගෙන ඉලක්ක ගත නිෂ්පාදනයට යොමු කිරීමට කටයුතු කෙරේ. ඒ මගින් අලෙවි අපහසුතා හා කෘෂි පාදක කර්මාන්ත සඳහා ඇති බාධක අවම කෙරන අතර, තාක්‍ෂණික කටයුතු ව්‍යාප්ත කිරීමද පහසු කෙරේ.

### රජයේ ගොවිපලවල් නිෂ්පාදනයට දයකකර ගැනීම

රජය සතු විවිධ දෙපාර්තමේන්තු, ආයතන හා මණ්ඩල සතුව ගොවිපල රාශියක් පවතී. තවද, ත්‍රිවිධ හමුදාව සතු ගොවිපලද ඇත. මෙම ගොවිපලවල් වල ඉඩම් වැඩි ප්‍රමාණයක් විවිධ හේතුන් නිසා ඵලදායි ලෙස භාවිතා නොවේ. මේ අනුව එම ගොවිපලවල දැනට ප්‍රයෝජනවත් ලෙස භාවිතයට නොගන්නා, එහෙත් වගා කළ හැකි සියලුම ඉඩම් 2007/08 මහ කන්නයේ සිට වගා කිරීමට කටයුතු කෙරේ.

### පුරන් කුඹුරු වගාවට යොදා ගැනීම

ශ්‍රී ලංකාවේ පවතින සෑම කෘෂි පාරිසරික කලාපයකම වී වගා කළ හැකි අතර, සෑම කලාපයකම සැළකිය යුතු ප්‍රමාණයක් දිගුකාලීනව හෝ කෙටි කාලීනව විවිධ හේතු නිසා පුරන් බවට කුඹුරු පත්වේ. ස්වාභාවික සාධකවල බාධාවන් නිසා වගා නොවන කුඹුරු හැර අනෙක් සියලුම පුරන් කුඹුරු වගා කිරීමට කටයුතු කරනු ලැබේ. මේ සඳහා පරිසරයට උචිත වී ප්‍රභේද ලබා දෙනු ඇත. වියළි කලාපයේ ජල හිඟ ප්‍රදේශවලට මාස 2 1/1-3 වයස් කාණ්ඩයේ ප්‍රභේද ලබා දෙනු ලබන අතර, තෙත් කලාපයේ වගා කිරීම සඳහා පාරම්පරික වී හා මා වී ප්‍රභේද හඳුන්වා දෙනු ලැබේ. වගා කිරීමට උත්සාහ නොගන්නා කුඹුරු ඉඩම්වල වගා කිරීමේ අයිතිය විධිමත් ගොවි සමිති හෝ ගොවි සංවිධාන වලට පවරනු ලැබේ. පුරන් කුඹුරුවල යෝග්‍යතාව අනුව කිසියම් බෝගයක් වගා කිරීම සහතික කිරීම සඳහා ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ.

### කාබනික පොහොර භාවිතය

අපේ මුතුන් මිත්තන් තම ආහාර නිපදවා ගනු ලැබුවේ කාබනික පොහොර භාවිතා කිරීමෙනි. නමුත් ලෝකය හරිත විප්ලවයත් සමඟ රසායනික පොහොර හඳුන්වාදීම නිසා ගොවිහු කාබනික පොහොර භාවිතයෙන් ඈත්වී රසායනික පොහොර භාවිතයට හුරුවූහ. මෙසේ දිගුකාලීනව රසායනික පොහොර භාවිතා කිරීම නිසා අස්වැන්න ප්‍රශස්ත තත්වයකට පවත්වා ගැනීමට හෝ වැඩිකර ගැනීමට නොහැකි තත්ත්වයක් විවිධ ආහාර භෝග ආශ්‍රිතව උදාවී ඇත. එසේම දිගුකාලීනව රසායනික පොහොර භාවිතා කිරීම නිසා පසෙහි පූර්ණ සාරවත් භාවය සැළකිය යුතු ලෙස පිරිහී ඇත. මෙය වර්තමානයේ කෘෂි භෝගවල අස්වැන්න වැඩිකර ගැනීමට එල්ලවී ඇති ප්‍රධාන තර්ජනයකි. එසේම රසායනික පොහොර ආනයනය සඳහා වාර්ෂිකව අධික මුදලක් රජය වැයකරයි. තවද, ලෝක වෙළඳපොලේ රසායනික පොහොර මිල නොකඩවා ඉහළ යමින් පවතී. මේ නිසා භෝග වගාවේ සාර්ථක අස්වැන්නක් ලබා ගැනීමටත්, පසේ සාරවත් බව රැක ගැනීමටත්, ස්ථාවර කෘෂිකර්ම රටාවක් බිහි කිරීමටත්, කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය ප්‍රචලිත කිරීම ජාතික අවශ්‍යතාවකි. මෙම කරුණු සාක්ෂාත් කර ගැනීම සඳහා දැනට සුලභව පවතින කාබනික අපද්‍රව්‍ය උපරිම ලෙස භෝග වගාවට භාවිතා කිරීම, සත්ව අපද්‍රව්‍ය භාවිතය, කාබනික පොහොර නිෂ්පාදනය සුලභ කිරීම සඳහා සත්ව පාලනය ප්‍රචලිත කිරීම, කාබනික පොහොර ලෙස භාවිතා කළ හැකි

ග්ලිරිසීඩියා, වල්සූරියකාන්ත, කැප්පෙටියා වැනි වගාවන් ඇති කිරීම, නාගරික කසල හා ගෙවතු අපද්‍රව්‍ය මගින් කොම්පෝස්ට් නිෂ්පාදනය හා භාවිතය ප්‍රචලිත කිරීම බලාපොරොත්තු වේ.

දේශීය ආහාර නිෂ්පාදන දිරිගැන්වීමේ ජාතික මෙහෙයුමේ ප්‍රධාන අංශයක් ලෙස කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය ප්‍රචලිත කිරීම සඳහා ඉහතින් සඳහන් කළ කාර්යයන් සියල්ලම සම්බන්ධීකරණය සඳහා අධිකාරී බලය සහිත අධිකාරියක් පිහිටුවීමට කටයුතු කෙරේ. ඒ යටතේ කාබනික පොහොර නිෂ්පාදනය විධිමත් කිරීම හා ප්‍රචලිත කිරීම, නිෂ්පාදනයට පහසුකම් සලසාදීම හා දිරි ගැන්වීම, භාවිතය ප්‍රචලිත කිරීම තුළින් රසායනික පොහොර ආනයනය ඉදිරි වසර තුන තුළදී 25% කින් අඩු කර ගැනීම යන අරමුණු ඉටු කර ගැනීමට බලාපොරොත්තු වේ.

## පරිසර හිතකාමී කෘෂි තාක්ෂණයන් ප්‍රවර්ධනය හා ප්‍රචලිත කිරීම.

රසායනික පොහොර භාවිතය අඩු කර කෘෂි රසායනික වර්ග අවම කරමින් නිෂ්පාදන මට්ටම ඉහළ තත්ත්වයකට නැංවීමේ වගා ක්‍රමවේදයන් කෘෂි කර්මාන්තයට හඳුන්වා දීමේ අවශ්‍යතාවය පැන නැගී ඇත. මේ සඳහා ඒකාබද්ධ පෝෂණ කළමනාකරණය සහ ඒකාබද්ධ පළිබෝධ මර්ධන ක්‍රමවේදයන් වැනි ආරක්ෂාකාරී වගා ක්‍රම හඳුන්වාදීමත්, කාබනික වගාවන් වැනි වස විස වලින් තොර බෝග නිෂ්පාදන ක්‍රම හඳුන්වා ඒවා ගොවීන් අතර ප්‍රචලිත කිරීමටත් කටයුතු කෙරේ.

## අලෙවි ක්‍රියාවලිය විධිමත් කිරීම

මේ සඳහා රාජ්‍ය අංශයේ මැදිහත්වීමද, පෞද්ගලික අංශය සම්බන්ධ කර ගැනීමට කටයුතු කෙරේ. වී අලෙවි මණ්ඩලය නැවත ස්ථාපිත කිරීමටද කටයුතු කෙරේ.

## පසු අස්වනු තාක්ෂණය ප්‍රචලිත කිරීම

ශ්‍රී ලංකාවේ නිපදවන එළවළු හා පළතුරු වල පසු අස්වනු හානිය 30% ක් පමණ වේ. එමෙන්ම වී හා අතිරේක භෝගවල ද පසු අස්වනු හානිය සැළකිය යුතු ප්‍රමාණයකි. පසු අස්වනු හානිය අඩු කිරීම සඳහා පසු අස්වනු තාක්ෂණයන් භාවිතා කිරීම මගින් ආහාර ද්‍රව්‍ය සුලභතාවය වැඩි කළ හැක. ශ්‍රී ලංකාවේ බොහොමයක් භෝග ගොවීන් විසින් අලෙවියට ඉදිරිපත් කරනුයේ ප්‍රාථමික නිෂ්පාදන ලෙසයි. ප්‍රාථමික නිෂ්පාදනයන්ගේ ගුණාත්මක භාවය වැඩි කිරීම, අගය වැඩි කිරීම, ද්විතික නිෂ්පාදනයන්ට යොමු කිරීම හා අතුරු නිෂ්පාදනවලට යොමු කිරීම තුළින් නිෂ්පාදනයට වැඩි ආදායමක් ලබා ගැනීමට ඉඩ සැලසෙනවා පමණක් නොව අනවශ්‍ය ලෙස අපතේ යාම අඩු කිරීම ද සිදුකළ හැක. මේ අනුව සියලුම නිෂ්පාදකයින්, මිලදීගන්නන්, තොග රැස් කරන්නන් හා ප්‍රවාහකයන් යන සියලුදෙනාම පසු අස්වනු තාක්ෂණය පිළිබඳව දැනුවත් කෙරෙන අතර, ඒ සඳහා උචිත ක්‍රම අනුගමනය කිරීමට පොළඹවනු ලැබේ. මේ හැර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් තෝරා පසු අස්වනු තාක්ෂණ ක්‍රම අනුගමනය කිරීමට අවශ්‍ය පහසුකම් සපයනු ලැබේ. පළතුරු හා එළවළු ප්‍රවාහනයේදී සිදුවන පසු අස්වනු හානිය අවම කර ගැනීමට ප්ලාස්ටික් ඇසුරුම් ලක්ෂ 3 ක් ඉදිරි වසර තුන තුළදී බෙදහැරීමට සැලසුම් කර ඇත. මෙම ඇසුරුම් ගොවීන්ට, අස්වනු එකතු කරන්නන්ට, ප්‍රවාහකයන්ට, තොග වෙළඳුන්ට හා සිල්ලර වෙළඳුන්ට යන එළවළු හා පළතුරු කර්මාන්ත දමයේ නියලෙන සියලු අය හට ලබාදීම අරමුණ වේ.

### මෙහෙයුම් ව්‍යුහය

දේශීය ආහාර නිෂ්පාදන දිරි ගැන්වීමේ ජාතික මෙහෙයුම මුළු රටම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීම ඉහළම බලාපොරොත්තුවයි. මේ සඳහා දේශපාලන, රාජ්‍ය හා සිවිල් සංවිධානවල උපදේශනය හා මඟපෙන්වීම නිරන්තරයෙන් ලබා ගැනීමට කටයුතු කෙරේ. ජාතික මට්ටමින්, පළාත් මට්ටමින්, දිස්ත්‍රික් මට්ටමින්, ප්‍රාදේශීය මට්ටමින් හා ග්‍රාමීය මට්ටමින් සැළසුම් මෙහෙයුම් හා පසු විපරම් කටයුතු විධිමත්ව සැළසුම් කර ඇත.



# දෙහි වලට ආදේශකයක් - කැලැමන්සි (Calamansi)



රුටේසියේ (Rutaceae) කුලයට අයත් මෙහි උද්භිද විද්‍යාත්මක නාමය Citrofortunella microcarpa දෙහි වෙනුවට ආදේශකයක් වශයෙන් කැලැමන්සි ප්‍රයෝජනයට ගත හැකිය. මෙහි සම්භවය පිලිපීනය වේ.

බඳුන් ශාකයක් ලෙසද, ස්ථිර භූමියේ සිටවීමෙන් ගෙවතු අලංකාරයටද යොද ගත හැකි ශාකයකි. පිලිපීනයේ මෙම භෝගය වාණිජ වශයෙන් වගා කරනු ලබයි. විටමින් සී අධික වන අතර, රසකාරකයක් වශයෙන් හා රස පානයකටද සුදුසුය. මෙහි ඇති ක්ෂාරීයතාවය නිසා රුධිර සංසරණයට හා ආහාර දිරවීම පහසු කිරීමට උපකාරි වේ.

වසර පුරාම ඵල දරණ කුඩා පඳුරකි. විවිධ දේශගුණික තත්ත්වයනට හොඳින් ඔරොත්තු දෙයි. උස මීටර් 2-5 ක් පමණ වේ. කොළපැහැ ඵල ඉදුනු පසු තැඹිලි පැහැයක් ගනී. ඵලය රවුම් වන අතර, එහි විශ්කම්භය සෙ.මී. 4.5 ක් පමණ වේ. මේරූ ඵලවල ඵලාවරණය ඉතා පහසුවෙන් ගැලවිය හැකිය. ඵලය තුළ ලා තැඹිලි පාට බණ්ඩිකා 7-10 පමණ ඇති අතර, බීජ 7-15 ක් පමණ අඩංගු වේ. එක් ඵලයකින් යුෂ මිලි ලීටර් 5-10 පමණ ලබාගත හැක. මිහිරි සුවඳින් යුක්තය. පත්‍රවල උඩ පෘෂ්ඨය තද කොළ පැහැතිය. යටි පැත්ත ලාකොළ පැහැතිය. පත්‍ර නටු කෙටිය.

6 වන පිටුවට...

# ඩේවිඩ්සෝනියා ශාකය හඳුනා ගනිමු

කියුනොනිසේසියේ (Cunonoiaceae) කුලයට අයත් ඩේවිඩ්සෝනියා උද්භිද විද්‍යාත්මකව ඩේවිඩ්සෝනියා ප්‍රෑරියන්ස් (*Davidsonia pruriens*) ලෙස හඳුන්වයි. කියුනොනිසේසියේ කුලයට ගණ 26 ක් අයත් වන අතර, ඩේවිඩ්සෝනියා (Davidsonia) යන ගණයට මෙම ශාකය අයත් වේ. අසූව දශකයේදී ලෝක ආහාර සංවිධානය මගින් පර්යේෂණ අත්හද බැලීම් සඳහා ඩේවිඩ්සෝනියා ශාකය ගන්නොරුව උද්‍යාන භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයට ලබාදී ඇත. දැනට ඵල දරණ තත්ත්වයේ ඇති මෙම ශාකයන් පොදු ව්‍යවහාරයේ රට ලොවි ලෙසද හඳුන්වයි. තවද නෝත් ක්වීන්ස්ලන්ඩ් ඩේවිඩ්සන්ස් ප්ලම් යන නාමයද මෙම ශාකයට භාවිතා වේ.



හිතකර පරිසර තත්ත්ව යටතේ මීටර් 10 ක් පමණ උසට වැඩේ. මෙහි කඳෙහි හා පත්‍රවල බූව (hairy) පැවතීම විශේෂ ලක්‍ෂණයක් වන අතර, ළපටි පත්‍ර දීප්තිමත් රෝස පැහැයක් ගනී. පත්‍රිකා 3-5 දක්වා වූ සංයුක්ත පත්‍රය සෙ.මී. 80 පමණ දිගට වැඩීමටද හැකිය. පුෂ්පය මනිපත්‍ර හා දල පත්‍ර 4 හෝ 5 කින් සමන්විතය. රතු දුඹුරු පැහැ පුෂ්ප මංජරියේ විශේෂ ලක්‍ෂණයක් වනුයේ සෘජුවම කඳෙන් මල් පොකුරු ලෙස හට ගැනීමයි. ඵලය ලොවි ගෙඩියකට

6 වන පිටුවට...

## කැලැමන්සි වගාව .........

බීජ මගින්, අතු බැඳීම හෝ බද්ධ ක්‍රම මගින් ප්‍රචාරණය කරගත හැක. ග්‍රාහක සඳහා දෙහි ලෙමන් වැනි ශාක යොදගත හැක. මෙසේ ලබා ගන්නා පැළයකින් වසර 1 1/2 කින් පමණ අස්වැන්න ලබාගත හැක. මෙහි අස්වැන්න වසරකට ගෙඩි 200-400 අතර වේ. මෙහි විශේෂ ලක්ෂණය වනුයේ වසර පුරා ගෙඩි ලබාගත හැකි වීමයි. කප්පාදු කිරීමෙන් ගසේ උස පාලනය කරගත හැකි අතර, අස්වැන්න නෙලා ගැනීමද පහසු කරයි. බීජ පැළ තරමක් උසට වැඩේ. පොළොව මට්ටමේ සිට අඩි 1 1/2 ක් පමණ ප්‍රධාන කඳ පමණක් සිටින සේ පහළින් එන අතු රිකිළි ඉවත්කර ශාකය හැඩගස්සවා ගැනීමෙන් අලංකාර ශාක ව්‍යුහයක් ලබාගත හැකිය. දෙහි වැනි භෝගයක් තෙත් කලාපයේ වගාකර හොඳ අස්වැන්නක් ලබාගත නොහැකි නමුත්, කැලැමන්සි වගා කිරීමෙන් හොඳ අස්වැන්නක් ලබා ගත හැකි අතර, දෙහි වෙනුවට පාවිච්චි කළ හැකිය.

*මූලාශ්‍රය: ඉන්ද්‍රාණී මැදගොඩ, උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නෝරුව, ජයන්තා ඉලංකෝන්, ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය, පේරාදෙණිය.*



*කැලමන්සි ඵල*



*පැසුනු කැලමන්සි ඵල හා යුෂ*

## ඩේවිඩ් සෝනියා .........

වඩා විශාල වන අතර, සාමාන්‍යයෙන් විශ්කම්භය සෙ.මී. 5 පමණ වේ. ඉඳුණු විට කළු දම් පැහැයක් ගනී. මාංශලය දම්පැහැ වන අතර, මෘදුයි. ඇඹුල් රසැතියි. මෙම ඵලය ඉතාමත් ප්‍රණීත ආකාරයේ පානයක් සෑදීමටද, ජෑම්, අයිස්ක්‍රීම්, සෝස් වර්ග නිෂ්පාදනයටද, විශේෂිත වූ රතු වයින් නිෂ්පාදනයටද, රූපලාවන්‍ය ක්‍රීම් නිෂ්පාදනයටද යොද ගනී.

*මූලාශ්‍රය: ඉන්ද්‍රාණී මැදගොඩ සහ සුදර්ශනී පෙරේරා, උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නොරුව, පේරාදෙණිය.*



*පුෂ්ප මංජරිය*



*ඩේවිඩ් සෝනියා ඵල*



*ඉදුනු ඵල*